කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක :02/2014

මගේ අංකය-DMS/CIR/2013/Research
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.
2014. 02. 11

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල සභාපතිවරුන්

**<u>2014 අයවැය යෝජනා අනුව පර්යේෂණ දීමනා ගෙවීම</u>**

2011 අයවැය යෝජනා අනුව පර්යේෂණ දීමනා ගෙවීම යන මැයෙන් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 45 හා 45(I) මෙයින් අවලංගු කරනු ලබන අතර, ඒ වෙනුවට 2014.01.01 දින සිට මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කෙරේ.

**02.** 2014 අයවැය යෝජනා අනුව රජයේ, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රජය සතු සමාගම් හා විශ්ව විද්‍යාලයන්හි නිලධාරීන්ට ගෙවන ලද දීමනා රහිත මූලික වැටුපෙන් සියයට විසි පහක්(25%) වූ පර්යේෂණ දීමනාව සියයට තිස්පහක් (35%) දක්වා වැඩි කරනු ලැබේ. මෙම දීමනාවට විශ්‍රාම වැටුප් හෝ ව්‍යවස්ථාපිත දීමනා හිමිකම් නොමැති අතර පහත සඳහන් විධිවිධානයන්ට යටත්ව මාසිකව ලබාදිය හැකිය.

**03.** **මෙම දීමනාව ලැබීමට සුදුසුකම් ඇති නිලධාරීන්;**

(I) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි සඳහන් නිර්වචනය අනුව "ජ්‍යෙෂ්ඨ මට්ටමේ" තනතුරක් සඳහා ස්ථිර පදනමින් පත්කර ඇති රාජ්‍ය නිලධාරීන්

(II) විශ්ව විද්‍යාල හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් පහත සඳහන් නිලධාරීන්

- ❖ කථිකාචාර්ය හා ඉන් ඉහළ මට්ටමේ ආචාර්යවරුන් (U-Ac 3, U-Ac 4, U-Ac 5) හා U-Ac 3, U-Ac 4, U-Ac 5 වැටුප් කාණ්ඩ යටතේ වැටුප් ලබන අනෙකුත් නිලධාරීන්
- ❖ වෛද්‍ය නිලධාරීන් (U-MO)
- ❖ මධ්‍යම මට්ටමේ හා ඉන් ඉහළ මට්ටමේ විධායක නිලධාරීන් (U-Ex 2, U-Ex 2a, U-Ex 3)

(III) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි සඳහන් නිර්වචනය අනුව අධ්‍යයන හා පර්යේෂණ (AR) හෝ කළමනාකාර (MM) සේවා ගණයේ හෝ ඉන් ඉහළ මට්ටමේ තනතුරක ස්ථිර සේවයේ නියුතු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන් හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල නිලධාරීන්

කොන්ත්‍රාත් හෝ අනියම් පදනම මත සේවය කරන නිලධාරීන් හට මෙම දීමනාව ඉල්ලුම් කිරීමට හිමිකම් නොමැත.

**04.** ක්‍රමවේදය

(I) ඉහත 03 ඡේදය යටතේ පර්යේෂණ දීමනාව ලබා ගැනීමට සුදුසුකම් ලබන නිලධාරීන් විසින් ඇමුණුම I හි සඳහන් පරිදි පර්යේෂණයෙහි ස්වභාවය, ක්‍රියාකාරී සැලැස්ම, පර්යේෂණ කාල රාමුව සහ ක්‍රමවේදය ඇතුලත් පර්යේෂණ යෝජනාවක් (Research Proposal) 05 (I) ඡේදයෙහි සඳහන් පර්යේෂණ කළමනාකරණය සඳහා වන කමිටුවට ඉදිරිපත් කොට අනුමැතිය ලබාගැනීමෙන් පසු, එම කමිටුව තීරණය කරන දිනක සිට ක්‍රියාත්මක වන පරිදි පර්යේෂණ දීමනාව ගෙවිය හැකිය.

(II) පර්යේෂණය ආරම්භ කළ දින සිට මාස හයක් (06) තුළ එකී යෝජනාවට අදාල ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය ඇතුළත් අන්තර් පර්යේෂණ වාර්තාවක් පර්යේෂණ කළමනාකරණය සඳහා වන කමිටුවට ඉදිරිපත් කළ යුතුය. එකී කමිටුව විසින් පර්යේෂණ කටයුතුවල ප්‍රගතිය පිළිබඳව සෑහීමකට පත් වන්නේ නම් පමණක්, තවදුරටත් පර්යේෂණ දීමනාව ගෙවීම අනුමත කළ හැකිය.

පර්යේෂණ කටයුතුවල ප්‍රගතිය පිළිබඳව සෑහීමකට පත් නොවන්නේ නම් පර්යේෂණය පිළිබඳ පිළිගත හැකි ප්‍රගතියක් පර්යේෂණ කළමනාකරණය සඳහා වන කමිටුව වෙත වාර්තා කිරීම සඳහා උපරිම වශයෙන් තවත් මාස හයක (06) කාලයක් ලබා දිය හැකි අතර එම ප්‍රගතිය අනුව පර්යේෂණ දීමනාව නැවත ගෙවීම ආරම්භ කළ යුතු දිනය කමිටුව විසින් තීරණය කළ යුතුය. පර්යේෂණයේ ස්වභාවය හා විෂය පථය සලකා බලා ගනිමින්, පර්යේෂණය කරන කාලය තුළ උපරිම වසර තුනක (03) ක කාලසීමාවකට යටත්ව පර්යේෂණ දීමනාව ගෙවිය හැකිය.

(III) අවසාන පර්යේෂණ වාර්තාව පර්යේෂණ කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වේ. එම වාර්තාව, පිළිගත් ජාත්‍යන්තර හෝ ජාතික මට්ටමේ ප්‍රකාශනයක පළවීම හා/ හෝ අදාල දාර්ශනිකයින්ගේ සම්භාෂණයක (Symposium) ට ඉදිරිපත් කිරීම හෝ අදාළ පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම පිළිබඳව 05 (II) ඡේදයෙහි සඳහන් පර්යේෂණ අධීක්ෂණ කමිටුව විසින් සෑහීමකට පත්වීම මත මෙම පර්යේෂණ දීමනාව තවදුරටත් ඉදිරි වසරක කාලයක් සඳහා ගෙවිය හැකිය.

හෝ

අවසාන පර්යේෂණ වාර්තාව බලයලත්/ ප්‍රකීර්ණ සඟරාවක (Accredited Journal) පළවීම පිළිබඳව පර්යේෂණ අධීක්ෂණ කමිටුව විසින් සෑහීමකට පත්වීම මත මෙම පර්යේෂණ දීමනාව තව දුරටත් ඉදිරි වසර තුනක (03) කාලයක් සඳහා ගෙවිය හැකිය.
(මේ අනුව අවසාන පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසුව පර්යේෂණ දීමනාව ලබා ගත හැකි උපරිම කාලය වසර තුන (03) කි.)

## 05. පර්යේෂණ අධීක්ෂණය සහ කළමනාකරණය සඳහා වන කමිටු

### (I) පර්යේෂණ කළමනාකරණය සඳහා වන කමිටු

පහත (II) ඡේදයෙහි සඳහන් පර්යේෂණ අධීක්ෂණ කමිටුව වෙත පර්යේෂණ ඇගයීම සඳහා වන යොමු කිරීමේ අනුදේශ (Terms Of Reference) ඉදිරිපත් කර අනුමත කරවා ගැනීම මෙම කමිටුවේ වගකීම වේ. තව ද කමිටුව වෙත ඉදිරිපත් වන පර්යේෂණ යෝජනා ඇගයීම හා වසර තුනක (03) ක උපරිමයකට යටත්ව පර්යේෂණ දීමනා ලබා දිය යුතු කාලසීමාව පිළිබඳව තීරණය කිරීම මෙම කමිටුවේ වගකීම වේ.

පර්යේෂණ කළමනාකරණය සඳහා වන කමිටු පහත පරිදි වේ.

අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා විශ්ව විද්‍යාල, උසස් අධ්‍යාපන ආයතනයන්හි කාර්ය මණ්ඩලයේ පර්යේෂණ යෝජනා - අදාල විශ්ව විද්‍යාලයේ සනාතන සභාව පිළිගත් පර්යේෂණ කමිටු හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් පර්යේෂණ කමිටු.

ආ) කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාලව, රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන නිලධාරීන්ගේ පර්යේෂණ යෝජනා - ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (CARP)

ඇ) අනෙකුත් ක්ෂේත්‍රයන්ට අදාල නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ යෝජනා - පර්යේෂණ අධීක්ෂණ කමිටුව විසින් හෝ අදාල පරිදි එම කමිටුව විසින් පත් කරනු ලබන අනු කමිටු

### (II) පර්යේෂණ අධීක්ෂණ කමිටුව

පර්යේෂණ කළමනාකරණය සඳහා මඟ පෙන්වීමට හා උපදෙස් ලබා දීමට තාක්ෂණ හා පර්යේෂණ විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතිත්වයෙන් හා පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත පර්යේෂණ අධීක්ෂණ කමිටුවක් වන්නේ ය. ඉහත (I) ඡේදයෙහි සඳහන් පර්යේෂණ කළමනාකරණය සඳහා වන කමිටු විසින් ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ ඇගයීම සඳහා වන යොමු කිරීමේ අනුදේශ (Terms Of Reference) අනුමත කළ යුතු වන්නේ මෙම කමිටුව විසිනි. මෙම කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

- සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්
- පරිසර විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්
- උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්
- රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්
- විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
- අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

### (III) පර්යේෂණ කළමනාකරණය සහ අධීක්ෂණය සඳහා වන කමිටුවල හා ඇගයීම් කමිටුවල සාමාජිකයින්ට පහත සඳහන් පරිදි ගෙවීම් කළ යුතුවේ.

- පර්යේෂණ කළමනාකරණ කමිටුවෙහි සාමාජිකයින් හා පර්යේෂණ යෝජනා ඇගයීම් කරන විශේෂඥයින් සඳහා එක් පර්යේෂණ යෝජනාවක් ඇගයීම සඳහා රු.1000/- බැගින්.
- පර්යේෂණ අධීක්ෂණ කමිටුවෙහි සාමාජිකයන් සඳහා, එක් කමිටු වාරයකට රු.4000/- බැගින්.

06. අනෙකුත් කොන්දේසි

(I) පර්යේෂණ සඳහා වන වියදම් ඒකාබද්ධ අරමුදලින් ආයතනවලට ලබා දෙන ප්‍රතිපාදනවලින් (මූල්‍යකරණ අංක 11) වැය නොකළ යුතුය. එහෙත් පර්යේෂණයේ ස්වභාවය අනුව, මූල්‍ය ආධාර අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ජාතික පර්යේෂණ කවුන්සලය හෝ ජාතික විද්‍යා පදනම වෙතින් ප්‍රතිපාදන ලබා දිය හැකිය.

(II) පර්යේෂණ දීමනාව, හා පර්යේෂණ කළමනාකරණය සඳහා වන කමිටු සඳහා ගෙවීම් වැය විෂය අංක 1003 න් හා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන හා රජය සතු සමාගම් සම්බන්ධයෙන් වනවිට ඒ ඒ ආයතනවල වැටුප් හා වේතන සඳහා වන වැය විෂයයන්ගෙන් දැරිය යුතුය.

(III) තම නිත්‍ය රාජකාරිවලට බාධාවක් නොවන පරිදි පර්යේෂණ කටයුතු සිදු කළ යුතුය.

(IV) මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාළ වනුයේ, 2014.01.01 දිනෙන් පසුවය. මෙදිනට පෙර ඉදිරිපත් කර ඇති, නමුත් අනුමත කර නොමැති ව්‍යාපෘති යෝජනාවන් අනුමත කිරීමේදී ද මෙම විධිවිධාන අදාළ කරගත යුතු වේ.

07. මෙම චක්‍රලේඛය රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු, උසස් අධ්‍යාපන, කෘෂිකර්ම සහ තාක්ෂණ හා පර්යේෂණ සහ අමාත්‍යාංශයන්හි එකඟතාවය මත නිකුත් කරන ලදී.

පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :-

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
4. ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය - සුදුසු පරිදි විශ්ව විද්‍යාල සඳහා අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම මැනවි
5. ලේකම්, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
6. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - සුදුසු පරිදි අදාළ ආයතන සඳහා අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම මැනවි.
7. විගණකාධිපති
8. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව